**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව - 2018**

-----------------------------------------------------------

**1.1 මතය**

**------**

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**-------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ.  කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්“මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

-------------------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනතේ 5(ආ) වගන්තිය | රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර විසින් විද්‍යාව හා තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකාව තුළ සිදුකරන ලද විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචන වාර්තාවේ කටයුතු අවසන් කර නොතිබුණි. 2017 වර්ෂය සඳහා වූ වාර්තාවද මූලික අදියරෙහි පැවතුණි. | 2017 වර්ෂයට අදාළ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචන වාර්තාව සඳහා අදාළ විද්‍යා හා තාක්ෂණ ආයතන වලින් අප වෙත තොරතුරු ලබාදීම ප්‍රමාද නිසා අදාළ දත්ත ඇතුලත් කර,විශ්ලේෂණය කර වාර්තාව සැකසීම 2018 වර්ෂය තුල අවසන් කිරීමට නොහැකි විය.2018 වර්ෂයට අදාළ සමාලෝචන වාර්තාව 2019 වර්ෂයේ අවසාන කාර්තුව වන විට සම්පූර්ණ කිරීමට සැළසුම් කර ඇත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කලයුතු බව. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016 ඔක්තෝබර් 07 දිනැති හා අංක PED/1/2005/(i) චක්‍රලේඛය | කිසියම් නිලධාරියෙකු මාසික ඉන්ධන දීමනාව හා ප්‍රවාහන දීමනාව ලබන්නේ නම් ආයතනයේ වාහන හෝ රියදුරන් රාජකාරි හෝ පෞද්ගලික කටයුතු වෙනුවෙන් යොදවා නොගත යුතු බව දක්වා තිබුණද කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ විසින් ඊට පටහැනිව කොමිෂන් සභාවට අයත් වාහන සහ රියදුරන් අවස්ථා 02 කදී භාවිතා කර තිබුණි. | මේ පිළිබඳව NASTEC ආයතනයේ අභ්‍යන්තර ගැටළු නිරාකරණය සඳහා පත් කර ඇති ත්‍රිපුද්ගල කමිටුව සොයාබලන අතර එහි වාර්තාව අනුව කටයුතු කරනු ඇත. | චක්‍ර ලේඛණයේ විධිවිධාන අනුව කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) භාණ්ඩාගාර ලේකම්ගේ 2010 දෙසැම්බර් 10 දිනැති හා අංක 1/2010 චක්‍රලේඛයේ (1)(ඊ) වගන්තිය | රාජ්‍ය ව්‍යවසායන්හි හා විශ්වවිද්‍යාල අනධ්‍යන කාර්ය මණ්ඩලයෙහි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් දරන වසර 12 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විධායක නිලධාරීන් හට තීරු බදු රහිත වාහන බලපත්‍රයක් ලබා ගැනීමට හැකිය. එසේ වුවද කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයාගේ සේවය 2003 ජූලි 31 දින ස්ථිර කර තිබියදී ඔහු 2011 ජුනි 08 දින තීරු බදු රහිත වාහන බලපත්‍රයක් මත චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව වාහනයක් ආනයනය කර තිබුණි. | සභාවේ අධ්‍යක්ෂ 1999 ජනවාරි 01වැනි දින කොන්ත්‍රාත් පදනම මත විද්‍යා වැඩසටහන් කළමණාකරු (II ශ්‍රේණිය) තනතුරට වසර දෙකක් සඳහා බඳවාගෙන ඇත.මෙම කොන්ත්‍රාත්තුව වරින් වර අඛණ්ඩව 2003 ජූලි 03 වැනි දින දක්වා ඉහත තනතුරෙහි දීර්ඝ කර ඇත.2003 ජූලි 31 වැනි දින ඔහුට ඉහත තනතුරේ ස්ථිර පත්වීමක් ලබාදී ඇත.<br>මේ අතර DMS 30 චක්‍රෙල්ඛයට අනුව 2007.02.13 වැනි දිනට මොහුට MM 1-3 වැටුප් කාණ්ඩයේ I වැනි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇත.<br>2011 වර්ෂයේ ඔහු ලබාගත් වාහන බලපත්‍ර හා සැලකීමේදී ,මොහු කොන්ත්‍රාත් කාලයත් සමඟවසර 12ක අවම සක්‍රීය සේවා කාලයක් සපුරා ඇති අතර කොන්ත්‍රාත් කාලය නොසලකා හැරියහොත් අවම වසර 12ක සේවා කාලය සපුරා නොමැත.<br>2011වසරට අදාළ චක්‍රලේඛ TTIP/01/2010(1)හි සක්‍රිය සේවා කාලයට කොන්ත්‍රාත් කාලය අඩංගු වන/නොවනබව පැහැදිළිව දක්වා නොමැත. | චක්‍ර ලේඛණයේ විධිවිධාන අනුව කටයුතු කල යුතු බව. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති හා අංක PED/12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය | විගණන කමිටුව මාස 03 කට එක් වරක් හෝ කැඳවිය යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2018 වර්ෂය තුලදී එක් විගණන කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් 04ක් පැවැත්වීමට සැලසුම් කළද වර්ෂයේ මුල් භාගයේදී ආයතනය තුළ පැවැති අර්බුධකාරි තත්වය ,සභාපතිවරයෙකු නොමැතිවීම, වර්ෂය අවසානයේ රට තුළ ඇතිවූ තත්වය යනාදිය හේතුවෙන් හා අනෙකුත් නොවැලැක්විය හැකි හේතූන් නිසා විගණන කමිටු රැස්වීම් 03ක් පැවැත්වීමට නොහැකිවිය. | චක්‍ර ලේඛණයේ විධිවිධාන අනුව කටයුතු කල යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,510,610 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,141,953 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,652,563 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ හා සංවර්ධනය සඳහා ලබාදී ඇති ප්‍රාග්ධන ප්‍රදාන රු.8,655,500 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ප්‍රවර්ථන වර්ෂයේදී ප්‍රධාන ආදායම් විෂයක් වන පර්යේෂණ හා සංවර්ධන ප්‍රාග්ධන ප්‍රදාන රු.8,655,500 කින් ඉහළ ගොස් ඇති අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 85 ක වර්ධනය වීමකි. එයට සාපේක්ෂව පර්යේෂණ හා සංවර්ධන වියදම රු.1,224,376 කින් ඉහළ ගොස් ඇත.

### 2.3 අනුපාත විශ්ලේෂණය

2018 වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් 1.12:1 ක් හා 1.1:1 ක් වූ අතර 2017 වර්ෂයේදී එම අයදුම්පත් පිළිවෙලින් 0.28:1 හා 0.26:1 ක් විය.2017 වර්ෂයට සාපේකෂව සමාලෝචිත වර්ෂයේදී කාරක ප්‍රාග්ධනයේ වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ මුදල් හා මුදල් සමාන දෑ රු.7,170,708 ක වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ආයතනික සමාලෝචනය ආයතන 06 ක් සැලසුම් කර ඇතත් ආයතන 03 ක් පමණක් සමාලෝචනය නිමකර තිබුණි. | 2018 වර්ෂයේ සමාලෝචනය සඳහා නුමත ආයතන 06න් ආයතන 03කින් ලැබියයුතු මූලික ඇගයීම් වාර්තාව (Self Assessment Report)එම වසර තුළ අප ආයතනයට ලබා නොදීම හේතුවෙන් එම ආයතන වල සමාලෝචන කටයුතු 2018 වසරේදී අවසන් කිරීමට නොහැකිවිය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුල ඉටු කිරීමට සැලසුම් කරන ලද කටයුතු සිදු කල යුතු බව. |

| | | |
|---|---|---|
| | ආයතන වලින් දත්ත එක්රැස් කිරීම කාර්යක්ෂම කිරීමේ අරමුණින් ජාතික විද්‍යා හා තාක්ෂණ දියුණු කිරීමේ පනතින් ලබාදී ඇති බලතල අනුව ගැසට් පත්‍රයක් නිකුත් කිරීමට නව කොමිසම කටයුතු කරමින් සිටී. | |
| (ආ) විද්‍යාත්මක හා තාක්ෂණික ගැටළු පිළිබඳ වර්තමාන වැදගත්කම පිළිබඳව අධ්‍යයන කණ්ඩායම් (Study Group) විසින් 2018 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර තිබූ ප්‍රතිපත්ති වාර්තා කිරීම හා ප්‍රතිපත්ති නිර්දේශ කිරීම් සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි. | 2018 වර්ෂයේ සිදු කිරීමට සැලසුම් කර තිබූ ප්‍රතිපත්ති වාර්තා 03ක් කෙටුම්පත් මට්ටම (Draft Level)දක්වා නිමකර ඇත.<br>නව වන ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුවට සමගාමීව ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති තුනක් සැකසීමට සැලසුම් කර අදාළ විද්වත් මණ්ඩල සැසි පැවැත්වූ නමුත් අදාළ සමුළුව 2018 වර්ෂයේ නොපැවැත්වීම හේතුවෙන් එම ප්‍රතිපත්ති එම වර්ෂය තුළ නිම කිරීමට නොහැකිවිය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුල ඉටු කිරීමට සැලසුම් කරන ලද කටයුතු සිදු කල යුතු බව. |
| (ඇ) විද්‍යා හා තාක්ෂණ අධ්‍යනය හා සම්පාදන ව්‍යාපෘති හරහා නිමකළ යුතු ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති 3 ම වර්ෂය තුළ නිම කළ යුතු වුවත් ඒවා නිම කර නොතිබුණි. | 2018 වර්ෂයේ සිදු කිරීමට සැලසුම් කර තිබූ ප්‍රතිපත්ති වාර්තා 03ක් කෙටුම්පත් මට්ටම (Draft Level)දක්වා නිමකර ඇත.<br>නව වන ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුවට සමගාමීව ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති තුනක් සැකසීමට සැලසුම් කර අදාළ විද්වත් මණ්ඩල සැසි පැවැත්වූ නමුත් අදාළ සමුළුව 2018 වර්ෂයේ නොපැවැත්වීම හේතුවෙන් එම ප්‍රතිපත්ති එම වර්ෂය තුළ නිම කිරීමට නොහැකිවිය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුල ඉටු කිරීමට සැලසුම් කරන ලද කටයුතු සිදු කල යුතු බව. |
| (ඇ) නව වන ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව (Biennial Conference on Science and Technology IX) පැවැත්වීමට කොමිෂන් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | නව වන ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව 2018 වර්ෂයේ නොවැම්බර් මස ගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට සැලසුම්කර තිබූ නමුත් මෙම වකවානුවේ රට තුල පැවති තත්වය හේතුවෙන් එම සමුළුව නොපැවැත්වූ අතර කොමිෂන් සභාව විසින් අදාළ සමුළුව 2019 වර්ෂයේ පැවැත්වීමට තීරණය කරන ලදී. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුල ඉටු කිරීමට සැලසුම් කරන ලද කටයුතු සිදු කල යුතු බව. |

## 3.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 133 අනුව කොමිෂන් සභාවේ වැඩ කටයුතු පරීක්ෂා කිරීම පිළිබඳව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබු අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් විගණන කටයුතු ආවරණය කර තිබුණි. එකී විගණක විසින් කොමිෂන් සභාවේ කටයුතු විගණනය කළ බවට වූ අභ්‍යන්තර විගණන වාර්තා මුදල් රෙගුලාසි 134(3) වගන්තිය අනුව විගණනයට වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණන කටයුතු කරනු ලබයි. | ජාතික විගණන පනතේ විධිවිධාන හා මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුය. |